සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

ගිණුම්කරණය	33	S	I	13 ශ්‍රේණිය	පැය දෙකයි

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලැබේ.

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති වරහන තුල ලියන්න.
- අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත හෝ වරහන තුල ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

ප්‍රශ්න අංක	ලකුණු
01-30	
31-50	
එකතුව	

01. ගිණුම්කරණයේ විශේෂ පරමාර්ථ තොරතුරු සම්බන්ධව පහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?

A. බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සපයයි.
B. එය ආයතනයක කළමනාකරණ තොරතුරු පද්ධතියේ කොටසකි.
C. එය ආයතනයක සියලු පාර්ශවයන්ට තොරතුරු සපයන තොරතුරු පද්ධතියේ කොටසකි.
D. එය ආයතනයේ සංවිධානාත්මක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීම හා පාලනය සඳහා අවශ්‍ය තොරතුරු සපයයි.

(1) *A* පමණි (2) *B* පමණි (3) *A B* පමණි
(4) *B D* පමණි (5)) *A, B C* පමණි

(.....)

02. පහත සඳහන් ප්‍රකාශන අතරින් කුමන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වන්නේද?

A. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් වගකීම් උපලබ්ධි කර ගත හැකි අගයට පෙන්වීම අඛණ්ඩ පැවැත්ම සංකල්පයට අනුව සිදු වේ
B. විකුණුම් අත්තිකාරම් ආදායම් ලෙස හඳුනා නොගැනීම උපලබ්ධි සංකල්පයට අනුව සිදු වේ
C. දේපළ පිරියත හා උපකරණ සම්බන්ධව පසුකාලීනව දරණ වියදම් පිරිවැයට වාර්තා කිරීම ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව සිදුවේ.
D. පෙර වර්ෂවල අනුගමනය කළ තොග අගය කිරීමේ ප්‍රතිපත්තියම ප්‍රවර්තන වර්ෂය තුළදී ද අනුගමනය කිරීම සංගතතා සංකල්පයට අනුව සිදු වේ.

(1) *A* පමණි (2) *A D* පමණි (3) *A, B C* පමණි
(4) *A, B D* පමණි (5) *B, C D* පමණි

(.....)

03. චාමර 2025.04.01 දින රු. 2,500,000 මුදලක් සහ 2025.04.05 දින රු. 1,000,000 ක් වටිනා ලොරි රථයක් යොදවමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. චාමර පළමු සතිය තුළ ව්‍යාපාරය සඳහා රු. 300,000 ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගත් අතර එයින් රු. 75,000 ක් වටිනා භාණ්ඩ පලුදු වීම නිසා ආපසු යවන ලදි. මෙම ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙලින් වන්නේ

(1) ජර්නල් වවුචරය, ලදුපත, ඉන්වොයිසිය, බැරපත
(2) ලදුපත, ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, හරපත
(3) ලදුපත, ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, හරපත
(4) ලදුපත, ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, බැරපත
(5) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, ලදුපත, බැරපත

(.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

04. දමිත්ගේ ව්‍යාපාරයේ 2025.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම අසමාන වූ බැවින් වෙනස අවිනිශ්චිත ගිණුමකට පිටපත් කර ආදායම් ප්‍රකාශනය පිළියෙල කළ අතර එහි කාලච්ඡේදයේ කෙටුම්පත් ශුද්ධ ලාභය 110,000 ක් විය. පසුව පහත වැරදි සිදුව තිබූ බව අනාවරණය කර ගන්නා ලදි.

- රු. 15,000 ක දුන්වට්ටම් ණයගැති පාලන ගිණුමට සහ ලද වට්ටම් ගිණුමට බැරකර ඇත.
- රු. 28,000 ක බැංකු ණය වාරිකය ගෙවීම බැංකු ණය පොලි ගිණුමට හර කර ඇති අතර වාරිකය තුළ ඇතුළත් පොලිය රු. 3000 කි. මෙම ගනුදෙනුවේ බැර සටහනක් වාර්තා කර නොමැත.
- රු. 12,000 ක ආපසු යැවුම් ආපසු යැවුම් ගිණුමේ පමණක් නිවැරදිව සටහන් කර ඇත.

වැරදි නිවරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය හා කාලච්ඡේදයේ නිවැරදි ශුද්ධ ලාභය කොපමණද?

අවිනිශ්චිත ගිණුමේ ශේෂය (රු.)	නිවැරදි කාලච්ඡේදයේ ලාභය (රු.)
(1) හර 46	105
(2) හර 14	115
(3) හර 14	105
(4) බැර 01	92
(5) බැර 14	115

(....)

05. VATලියාපදිංචි වි ඇති ව්‍යාපාරයේ VAT රහිත මිල රු. 100,000 ක් වූ භාණ්ඩ ණයට අලෙවි කළ අතර ඒවායේ පැවති දෝෂයක් හේතුවෙන් නැවත ආපසු එවන ලදි. VAT අනුපාතය 18% ක් නම් භාණ්ඩ ආපසු එවීමේ ගනුදෙනුව ලෙජරයට පිටපත් කිරීමේ නිවැරදි ජර්නල් සටහන වන්නේ

(1)	ණයගැති පාලන ගිණුම	හර	118,000
	ආපසු එවුම් ගිණුම	බැර	118,000
(2)	ආපසු එවුම් ගිණුම	හර	118,000
	ණයගැති ගිණුම	බැර	118,000
(3)	ආපසු එවුම් ගිණුම	හර	118,000
	ණයගැති පාලන ගිණුම	බැර	118,000
(4)	ණයගැති පාලන ගිණුම	හර	118,000
	ආපසු එවුම් ගිණුම	බැර	100,000
	VAT පාලන ගිණුම	බැර	18,000
(5)	ආපසු එවුම් ගිණුම	හර	100,000
	VAT පාලන ගිණුම	හර	18,000
	ණයගැති පාලන ගිණුම	බැර	118,000

(.....)

06. තනි පුද්ගල ව්‍යාපාරයක් වූ අවින්තාගේ ව්‍යාපාරයේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළිවලින් රුපියල් 100,000 හා 80,000 දළ ලාභයක් හා ශුද්ධ ලාබයක් වාර්තා කරන ලදි. වර්ෂය තුළ රු. 12,000 ක තොග හානි වී ඇත. 2025.03.31 දිනට ව්‍යාපාරයේ පැවති භෞතික තොගය මත අවසාන තොගය ආගණනය කර ඇත. කෙසේ වුවද තොග හානි විම සම්බන්ධව ගිණුම් පොත්වල සටහන් තබා නොමැත. තොග හානිය ගැලපූ පසු නිවැරදි දළ ලාභය හා ශුද්ධ ලාභය කොපමණද?

දළ ලාභය	ශුද්ධ ලාභය
(1) 88,000	68,000
(2(88,000	92,000
3) 112,000	80,000
(4) 112,000	92,000
(5) 88,000	68,000

(.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

ප්‍රශ්න අංක 07 සහ 08 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.
...සේලගේ රු. 200,000 ක මුදලක් හා රු. 500,000 ක බැංකු ණයක් ගෙන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. මෙම ආයතනය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. ගැණුම් හා විකුණුම් තුළ 15% VAT ඇතුළත් වේ.

2025.03.31 දිනෙන් අවසන් මාසයේ පහත ගනුදෙනු සිදුවිය.

- රුපියල් 345,000 ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදි
- මෙම භාණ්ඩවලින් (VAT සහිත මිලට) 115,000 භාණ්ඩ ආපසු යවන ලදි
- ඉතිරි භාණ්ඩ සියල්ල රුපියල් 322,000 කට ණයට විකුණන ලදි. (VAT සහිත මිල)
- රු. 10,000 වට්ටමකට යටත්ව ණය හිමියන් මුදල් ගෙවා පියවන ලදි.

07. 2025.03.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය හා මුළු වගකීම වන්නේ

දළ ලාභය	මුළු වගකීම
(1) 92,000	542,000
(2) 80,000	512,000
(3) 90,000	512,000
(4) 102,000	500,000
(5) 80,000	4800,000

(.....)

08. 2025.03.31 දිනට ශුද්ධ ලාභය හා මුදල් ශේෂය කොපමණද?

ශුද්ධ ලාභය	මුදල් ශේෂය
(1) 322,000	802,000
(2) 92,000	500,000
(3) 90,000	480,000
(4) 80,000	480,000
(5) 80,000	200,000

(.....)

09. සිමිත අරලිය සමාගමට අදාළ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

අමුද්‍රව්‍ය මිලට ගැනීම	750,000
අමුද්‍රව්‍ය ආපසු යැවුම්	20,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලි	40,000
ඍජු වේතන	250,000
අමුද්‍රව්‍ය තොගවල අඩුවීම	60,000
ගෙන යමේ කුලි	75,000
නිෂ්පාදන පොදු කාර්ය	172,000
නොනිමි ද්‍රව්‍ය වල වැඩිවීම	27,000

ඉහත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය තුළ කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රයේ ක්ෂය 25,000 ක් හා ඇඹරුම් යන්ත්‍රයේ ක්ෂය 12,000 ක් ඇතුළත්ව ඇත.
නිෂ්පාදනය කළ භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය වන්නේ

(1) රු. 1200 (2) රු. 1188 (3) රු. 1300
(4) රු. 1275 (5) රු. 1080 (.....)

10. නිෂ්පාදන ආයතනයක පිරිවැය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ නිවැරදි වේද?

A. මුළු පිරිවැය හා මුළු නිෂ්පාදන නොවන පිරිවැය අතර වෙනස නිෂ්පාදන පිරිවැයයි .

B. මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ලෙස වර්ග කළ හැකිය.

C. මුළු නිෂ්පාදන පිරිවැය ප්‍රාථමික පිරිවැය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය විචල්‍ය පොදු කාර්ය පිරිවැය වලින් සමන්විත වේ.

D. නිෂ්පාදන පිරිවැය සමන්විත වන්නේ ප්‍රාථමික පිරිවැය, නිෂ්පාදන විචල්‍ය පොදු කාර්ය පිරිවැය ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වල එකතුවෙනි. නිවැරදි පිළිතුර වන්නේ

(1) AD පමණි (2) AB පමණි (3) ABD පමණි
(4) ABC පමණි (4) ABCD යන සියල්ලම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

- අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

අමල් සහ නිමල් විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2024.04.01 දින බිමල් නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගත් අතර 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (රු. 000)

	අමල්	නිමල්	බිමල්		අමල්	නිමල්	බිමල්
කීර්ති නාමය	?	?	?	ඉ/ගෙ/ ශේෂය	3000	2000	
ප/ගෙ/ශේෂය	?	?	?	මුදල්			1000
				කීර්ති නාමය	360	240	
				ඉ/ගෙ/ ශේෂය			

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (රු. 000)

	අමල්	නිමල්	බිමල්		අමල්	නිමල්	බිමල්
ගැනිලි	120	60	40	ඉ/ගෙ/ ශේ	500	200	
				ප්‍රාග්ධන පොලි	300	200	100
				හවුල් වේතන	150	100	
ප/ගෙ/ශේෂය	950	560	120	ලාභ කොටස්	120	120	60
	1070	620	160		1070	620	160

හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේදී අමල් විසින් තම පෞද්ගලික මුදලින් ගෙවූ රු. 20,000 ක් වූ හවුල් ව්‍යාපාරයේ විදුලි බිල පොත් වලින් මග හැරී තිබූ අතර 2025.03.31 දිනට තොගය රු. 40,000 කින් අධිතක්සේරු වී ඇත.

11. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ **නිවැරදි විසර්ජනය කළ හැකි ලාභය** වන්නේ

(1) රු. 1,190,000 (2) රු. 1,150,000 (3) 1,090,000

(4) රු. 1,130,000 (5) රු. 1,170,000 (.....)

12. හවුල් ව්‍යාපාරයේ 2025.03.31 දිනට **හිමිකම** වන්නේ

(1) රු. 7,630,000 (2) රු. 8,630,000 (3) රු.6,700,000

(4) රු. 7,590,000 (5) රු. 7,150,000 (.....)

13. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තොරතුරුවල පැවතියයුතු **මූලික ගුණාත්මක ලක්ෂණ** වන්නේ

A අදාළ බව B කාලීන බව C සත්‍යාපනය කළ හැකි බව D විශ්වාසනිය නියෝජ්‍යත්වය

(1) *AB* පමණි (2) *AD* පමණි (3) *CD* පමණි

(4) *B D* පමණි (5) *AC* පමණි (.....)

- අංක 14 සිට 15 දක්වා පිළිතුරු සැපයිම සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න. ට භාවිතා කරන්න.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත කදුරට පොදු සමාගමට අදාළය පහත තොරතුරු සපයයි

	(රු.000)
විකුණුම් අයභාරය	2000
ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය	300
සැපයුම්කරුවන් ගෙන් ලද වෙළඳ වට්ටම	150
යන්ත්‍ර විකුණුම් මත ලාභය	300
විකුණුම් පිරිවැය	800
පරිපාලන හා බෙදාහැරීමේ වියදම්	300

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉඩම් ප්‍රත්‍යාගණනය මත රු. 250 හිගයක් ඇති වූ අතර සමාගම එය වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources iexamhub CamScanner

25.03.31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සමාගම හඳුනාගත් මුළු ආදායම හා මුළු විස්තිරණ ආදායම

මුළු ආදායම (රු. 000)	මුළු විස්තිරණ ආදායම (රු. 000)
(1) 1150	1400
(2) 900	1200
(3) 2450	1200
(4) 2600	1450
(5) 2600	1500

(.....)

15. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ පොත්වල විස්තිරණ ආදායම හා රඳවාගත් ඉපයුම් වෙනස්වීම කොපමණද?

වෙනත් විස්තිරණ ආදායම (රු. 000)	**රඳවාගත් ඉපයුම්** (රු. 000)
(1) (250)	950
(2) 300	900
(3) 50	1450
(4) 1500	1450
(5) 1150	1400

(.....)

16. එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක 2025/4/01 අත්පත් කරගත් යන්ත්‍රයකට පහත තොරතුරු අදාළය.

10% VAT ඇතුළුව ගෙවූ මුදල	1,100,000
වරායේ සිට ව්‍යාපාරයට ප්‍රවාහනය කිරීමේ පිරිවැය	100,000
වැඩබිම සකස් කිරීමේ පිරිවැය	80,000
මූලික පරීක්ෂණ පිරිවැය (පරීක්ෂණ පිරිවැය තුළ රු. 50,000 විශේෂඥ ගාස්තු ඇතුළත්ය.)	200,000

L.K.A.S.16 දේපළ පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුව ආරම්භක හඳුනාගැනීමේදී යන්ත්‍රයේ පිරිවැය

(1) 1,450,000 (2) 1,500,000 (3) 1,350,000
(4) 1,400,000 (5) 1,230,000

(.....)

17. සීමිත රුවන් සමාගම රු. 9,510,000 කට කල්බදු පදනමට මිලට ගත් යන්ත්‍රයක 2023.04.01 දිනට ගෙවිය යුතු කල්බදු වගකීම 7,461,000 ක් විය. වාර්ෂිකව කල්බදු වාරිකය 3,000,000 වන අතර වාර්ෂික කල්බදු පොලිය පහත දැක්වේ.

වර්ෂය	**පොළිය**
2022/23	951,000
2023/24	746,000
2024/25	521,000
2025/26	272,000

වාර්ෂික කල්බදු වාරිකය සෑම වසරකම මාර්තු 31 දිනට ගෙවිය යුතුය. 2023/24 වර්ෂය සඳහා කල්බදු වාරිකය 2024/03/31 දින වන විටත් ගෙවා නැත.
2024/03/31 දිනට හඳුනා ගත යුතු කල්බදු ජංගම හා ජංගම නොවන වගකීම වන්නේ

	ජංගම වගකීම	**ජංගම නොවන වගකීම**
(1)	5,207,000	2,254,000
(2)	2,479,000	2,728,000
(3)	5,479,000	2,728,000
(4)	2,728,000	2,479,000
(5)	3,000,000	2,207,000

(.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

18. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා සීමිත නිසල පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2025.06.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදි. 2025.03.31 සහ 2025.06.30 අතර කාලය තුළ පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A. 2025.04.15 දින සිදු කළ ණයට විකුණුම් නිසා ඇතිවූ 250,000 ක ශේෂයක් සහිත ණය ගැතියෙකු 2025.06.20 දින බුන්වත් විය.

B. 2025.04.01 දින රු. 75,000 ක අලාභයක් ජනනය කරමින් ව්‍යාපාරයේ 2025.03.31 දින පැවති තොගයක් ගින්නෙන් විනාශ විය

C. 2025.02.15 සමාගමට විරුද්ධව පවරන ලද නඩුවක තීන්දුව 2025.06.15 ලබාදුන් අතර රු. 40,000 ක දඩයක් රජයට ගෙවීමට නියම විය

D. 2025.05.01 සිට සමාගමේ ආයෝජනවල වෙළඳපොල වටිනාකම අඛණ්ඩව පහළ වැටීම

L.K.A.S.10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව **නොගලපන සිදුවීම්**

(1) A D පමණි (2) AB C පමණි (3) ABD පමණි
(4) BC D පමණි (4) ABCD යන සියල්ලම

(.....)

■ **අංක 19 සිට 20 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2024.03.31 දිනට සීමිත ජීවන්ත පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත ශේෂ උපුටා ගන්නා ලදි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය 1 ක් රුපියල් 10 බැගින් නිකුත් කළ සාමාන්‍ය කොටස්(75000)	75,0000
පොදු සංචිතය	500,000
රඳවාගත් ඉපයුම්	900,000

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම විසින් සිදු කළ ගනුදෙනු පහත පරිදි වේ

1. 2024.04.01 දිනට කොටසක් රු. 20 බැගින් කොටස් 15,000 ක් ප්‍රසිද්ධ කොටස් නිකුත්වක් කරන ලදි. කොටස් 25,000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. කොටස් සමානුපාතිකව විභාජනය කරන ලදි.
2. 2024.12.31 දින එදිනට පැවති සෑම කොටස් තුනකටම එක බැගින් කොටසක් රු. 15 බැගින් හිමිකම් නිකුතුවක් සිදු කරන ලදි. සියළුම කොටස් මිලට ගන්නා ලදි.
3. 2025.01.15 දිනට එදිනට පැවති සෑම කොටස් 4 කට එක බැගින් කොටසක් රුපියල් 25 බැගින් රඳවා ගත් ඉපයුම් ප්‍රාග්ධනිත කරන ලදි.
4. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය 500,000 කි. වර්ෂය තුළ ගෙවූ ලාභාංශය රුපියල් 200,000 කි.

19. 2025.03.31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් හා කොටස් නිකුතුව තුළින් ලද මුදල වන්නේ

	ප්‍රකාශිත ප්‍රාග්ධනය(සාමාන්‍ය කොටස් රුපියල්)	**කොටස් නිකුතුව තුළින් ලද මුදල**
(1)	1,800,000	750,000
(2)	1,800,000	300,000
(3)	2,250,000	750,000
(4)	1,500,000	1,500,000
(5)	750,000	1,050,000

(.....)

20. 2025.03.31 දිනට හිමිකම හා රඳවාගත් ඉපයුම වන්නේ

	හිමිකම (රු)	**රඳවාගත් ඉපයුම (රු)**
(1)	2,000,000	300,000
(2)	2,450,000	350,000
(3)	2,350,000	350,000
(4)	2,050,000	450,000
(5)	2,450,000	300,000

(.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

පහත සඳහන් තොරතුරු සුපුරු සමාගමට අදාළව සපයා ඇත.

සමාගමේ සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් සඳහා (EPF) දායකත්වය පිළිවෙලින් සේවායොජකයාගෙන් 12% ක් හා සේවකයාගෙන් 8% ක් බැගින්ය. 2025 මැයි මාසය සඳහා ගෙවන ලද සේවක භාර අරමුදල් (ETF) 3% බැගින් වන අතර ETF ගෙවීම 27300 කි. EPF හා ETF දායකත්වයන් සේවකයන්ගෙන් මූලික වැටුප මත ගණනය කරනු ලබයි. උත්සව අත්තිකාරම් සඳහා රු. 50,000 ක් සමාගම අයකර ගෙන ඇති අතර අතිකාල දීමනා ලෙස
රු. 120,000 ක් සමාගම ගෙවා ඇත.
2025 මැයි මාසය සඳහා සේවකයන්ට ගෙවන ලද ශුද්ධ වැටුප වන්නේ

(1) රු. 879,300 (2) රු. 952,700 (3) රු. 997,600
(4) රු. 907,200 (5) රු. 870,800

(.....)

22. පහත තොරතුරු 2025 මාර්තු මාසය සඳහා සමාගමක තොග අයිතමයකට අදාළ වේ.

දිනය	විස්තරය	ප්‍රමාණය	ඒකක මිල
2025/03/01	ගැනුම්	1000	75
2025/03/10	ගැනුම්	4000	85
2025/03/20	විකුණුම්	2500	-

තොග නිකුත් කිරීම ප්‍රථම ලැබීම ප්‍රථම නිකුතු ක්‍රමය (FIFO) භාවිතා කර සිදුකරන අතර අවසාන තොග ඒකකයක ශුද්ධ උපලබ්ධි අගය 80 කි

විකුණුම් පිරිවැය හා දළ ලාභය වන්නේ

	විකුණුම් පිරිවැය	දළ ලාභය
(1)	212,500	75,000
(2)	202,500	212,500
(3)	202,500	200,000
(4)	212,500	212,500
(5)	250,000	250,000

(.....)

23. සමාගමක ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 2:1 සහ වාර 1 ක් විය. අනෙකුත් සියළු සාධක නොවෙනස්ව තිබියදී භාණ්ඩ ණයට මිලදී ගැනීම තුළින් මෙම අනුපාත දෙකට ඇතිවන බලපෑම කුමක්ද?

ජංගම අනුපාතය	ක්ෂණික අනුපාතය
(1) අඩු වේ	අඩු වේ
(2) වැඩි වේ	වැඩි වේ
(3) වැඩිවේ	අඩු වේ
(4) අඩු වේ	වැඩිවේ
(5) වෙනස් නොවේ	වෙනස් නොවේ

(.....)

24. සිනිත සුමනසිරි සමාගමේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයයි.

බදු පෙර ලාභය	1,180,000
ක්ෂය	40,000
මෝටර් රථ විකුණුම් ලාභය	80,000
වෙළඳ ගෙවිය යුතු දෑ අඩුවීම	150,000
වෙළඳ ලැබිය යුතු දෑ වැඩිවීම	200,000

මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ වන වැඩිවීම හෝ අඩුවීම කොපමණද?

(1) 1490,000 වැඩිවීම (2) 1,490,000 ක් අඩුවීම (3) 790,000 වැඩිවීම
(4) 1,270,000 වැඩිවීම (5) 1,190,000 වැඩිවීම

(.....)

25. ව්‍යාපාරයකට දිගුකාලීන ණයක් ලබා දීමේදී බැංකුවක් විසින් වඩාත් වැදගත් යැයි සලකනු ලබන්නේ පහත සඳහන් අනුපාත කාණ්ඩ අතරින් කුමන අනුපාත කාණ්ඩයද?

(1) තොග පිරිවැටුම, සාමාන්‍ය ණය පියවීමේ කාලය, තොලන අනුපාතය
(2) පොලී ආවරණ අනුපාතය, තොලන අනුපාතය, වත්කම් පිරිවැටුම් අනුපාතය
(3) තොග පිරිවැටුම, ස්ථාවර වත්කම් පිරිවැටුම, පොලී ආවරණ අනුපාතය
(4) ශුද්ධ ලාභ අනුපාතය, වත්කම් මත ප්‍රතිලාභ, තොග පිරිවැටුම
(5) ජංගම අනුපාතය, ක්ෂණික අනුපාතය, සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය (.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

26. පහත තොරතුරු රුක්මල් සමාගමේ අමුද්‍රව්‍යයකට අදාළ වේ.

ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)	ඒකක 1000
ඇණවුම් පිරිවැය	රු.100
ඒකකයක් රඳවා ගැනීමේ පිරිවැය	රු. 10

වාර්ෂික ඉල්ලුම වනුයේ

(1) ඒකක 45,000 (2) ඒකක 100,000 (3) ඒකක 5,000
(4) ඒකක 50,000 (5) ඒකක 30,000

(.....)

27. පහත කුමන කාර්යයන් ආයතනයක කළමනාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි වේද

A. ව්‍යාපෘති ඇගයීම සඳහා මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම

B. පාලන කාර්යය සඳහා පිරිවැය පාලනය කළ හැකි පිරිවැය හා පාලනය කළ නොහැකි ලෙස වර්ගීකරණය කිරීම

C. එය අනාගත කටයුතු සැලසුම් කිරීම සඳහා භාවිතා කරයි

D. ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය කිරීම කළමනාකරණ ගිණුම්කරණයට අයත් වේ

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුර වන්නේ

(1) ABD පමණි (2) BC D පමණි (3) AC D පමණි
(4) ABC පමණි (4) A BCD යන සියල්ලම (.....)

28. පිරිවැය පරිමා ලාභ (CVP) විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශන **සත්‍ය** වේද?

A. සමච්ඡේදන ලක්ෂයට පෙර ස්ථාවර පිරිවැය දායකයට වඩා වැඩිවේ

B. සමච්ඡේදන ලක්ෂයෙන් පසු දායකය ලාභයට සමාන වේ

C. සමච්ඡේදන ලක්ෂයේදී මුළු දායකය මුළු පිරිවැයට සමාන වේ

D. සමච්ඡේදන ලක්ෂයේදී මුළු ස්ථාවර පිරිවැයෙහි සහ මුළු විචල්‍ය පිරිවැයෙහි එකතුව මුළු විකුණුම් ආදායමට සමාන වේ

(1) A D පමණි (2) BC D පමණි (3) AB C පමණි
(4) AB D පමණි (4) ABC D යන සියල්ලම (.....)

29. සිමිත නිර්මාණි සමාගමේ නිෂ්පාදනය කරන භාණ්ඩයට අදාළ පහත තොරතුරු සපයයි.

	(රු. 000)
විකුණුම්	3600
විචල්‍ය පිරිවැය	(1440)
දායකය	2160
ස්ථාවර පිරිවැය	(720)
ලාභය	1440

වර්තමාන ක්‍රියාකාරී මට්ටමේදී **සමච්ඡේදන ලක්ෂය සහ ආරක්ෂිත ආන්තිකය** (රුපියල් වලින්)

	සමච්ඡේදන ලක්ෂය (රු 000)	**ආරක්ෂිත ආන්තිකය (රු. 000)**
(1)	1200	2880
(2)	1920	240
(3)	2400	1200
(4)	1200	2400
(5)	720	980

(.....)

30. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී පහත කුමන සාධකය ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය අඩුවීමට බලපායිද?

A. වට්ටම් සාධනය වැඩිවීම

B. ආරම්භක ආයෝජනය අඩුවීම

C. ශුද්ධ මෙහෙයුම් මුදල් ගලා ඒම අඩු වීම

D. ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීමේදී පිරිවැය වැඩිවීම

(1) AB C පමණි (2) BC D පමණි (3) A C පමණි
(4) D C පමණි (4) AC D යන සියල්ලම (.....)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

...ගමක පහත එක් එක් අවස්ථාවට වඩාත් අදාළවන **ගිණුම්කරණ සංකල්ප** සඳහන් කරන්න.

A. භාණ්ඩ භාරදීමට පෙර ගනුදෙනුකරුවන්ගෙන් ලද අත්තිකාරකමක් වගකීමක් ලෙස හඳුනා ගැනීම ....

B. විකුණු භාණ්ඩ සඳහා ලබාදුන් වගකීම් සහතික සඳහා ප්‍රත්‍යාගණනයක් කිරීම ....

C. බෙදා හැරීමේ මෝටර් රථ ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීම ....

D. වත්කම් ශුද්ධ උපලබ්ධි අගයට හඳුනා නොගෙන පිරිවැය හෝ ප්‍රත්‍යාගනිත අගයට හඳුනාගැනීම ....

32. ව්‍යාපාරයක් විසින් පිළියෙල කරනු ලබන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පහත කුමන ප්‍රකාශන **සත්‍යද (T) අසත්‍යද (F)** යන්න සඳහන් කරන්න.

සත්‍ය / අසත්‍ය

A. පොදු පරමාර්ථ ප්‍රකාශන මූලික වශයෙන් ව්‍යාපාරයට සම්පත් සපයන පාර්ශවවල භාවිතය සඳහා පිළියෙල කරනු ලබයි ....

B. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන ආයෝජකයින් ණයහිමියන් හා වෙනත් ණය සැපයුම්කරුවන් භාවිතට ගනී ....

C. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන ව්‍යාපාරයක ප්‍රවර්තන අගය පදනම මත පමණක් මිනුම් කරන ලද තොරතුරු සපයනු ලබයි ....

D. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම අඛණ්ඩ පැවත්ම උපකල්පනය මත සිදුකරයි ....

33. පහත ගිණුම් මූල්‍ය ප්‍රකාශන වල කුමන **ගිණුම්කරණ මූලිකාංගයට** අයත් වන්නේ දැයි සඳහන් කරන්න.

ගිණුම	**ගිණුම්කරණ මූලිකාංගය**
A. ගැනිලි	....
B. ආපසු එවුම්	....
C. සමුච්චිත ක්ෂය	....
D. වෙළඳ ලැබිය යුතුද දෑ මත අපේක්ෂිත අලාභ සඳහා ඉඩහැරීම	....

34. පෙරේරාගේ ව්‍යාපාරයේ 2024.04.01 දිනට තොගය 50,000 ක් විය. ව්‍යාපාරය පිරිවැය 25% ලාභාන්තිකයක් පවත්වාගෙන යමින් භාණ්ඩ විකුණනු ලබයි. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් රු. 1000000 ක් විය. 2025.03.31 දිනට තොගයේ පිරිවැය රුපියල් 65,000 ක් විය.

පහත දෑ ගණනය කරන්න.

අ) වර්ෂයේ දළ ලාභය (රු) ....

ආ) වර්ෂය තුළ ගැනුම් (රු) ....

35. ආයතනයක සුළු මුදල් අග්‍රිම ක්‍රමය අනුගමනය කරයි. සෑම මසකම අවසානයේදී සුළු මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබයි. 2025.02.28 දිනට සුළු මුදල් භාරකරු සතුව රු. 1200 ක මුදලක් පැවතුණ අතර 2025.03.31 දිනට ඔහු සතුව පැවති මුදල රු. 1500 කි. පෙබරවාරි මාසය තුළදී සුළු මුදල් භාරකරු විසින් කරන ලද සුළු මුදල් වියදම් ප්‍රමාණය රු. 5600 කි. මාර්තු මස සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් ඉහළ දැමීමට ආයතනය තීරණය කරන ලදී.

අ) 2025.04.01 දින **ප්‍රතිපූර්ණය කළ යුතු මුදල** කොපමණද? (රු) ....

36. ක්‍රීඩා සමාජයක 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද අතිරික්තය රු. 600,000 ක් විය. කෙසේ නමුත් අතිරික්තය ගණනයේදී පහත අයිතම මග හැරී ඇති බව අනාවරණය විය. මෙම අයිතම ගැලපීම මගින් ගණනය කරන ලද අතිරික්තය **වැඩිවේ (I) අඩුවේ (D) හෝ වෙනස් නොවේ (NC)** යන්න දක්වන්න.

	අතිරික්තයට වන බලපෑම (I/D/ NC ලෙස දැක්වීම)
A. හිඟ සාමාජික මුදල් කපා හැරීම	....
B. සාමාන්‍ය මුදල් පරිත්‍යාගයක් ලැබීම	....
C. ගිණුම් වර්ෂය අවසාන දිනට ලැබිය යුතු සාමාජික මුදල්	....
D. ගොඩනැගිලි ඉදිකිරීමේ අරමුදල සඳහා මුදල් පරිත්‍යාග ලැබීම	....

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

37. පහත සඳහන් ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් ක...

ප්‍රකාශය	**සත්‍ය / අසත්‍ය**
A. කාලය සහ වටිනාකම අවිනිශ්චිත වූ විය හැකි බැඳීම් ප්‍රතිපාදන වේ	....
B. ගිණුම්කරණ වැරදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනාවරණය කිරීමේදී පමණක් නොව මූල්‍යප්‍රකාශන වල මූලිකාංග හඳුනා ගැනීම හා මැනීමේ දී ත් සිදු විය හැක	....
C. විකුණන ලද දෝෂ සහිත භාණ්ඩ අළුත්වැඩියා කිරීම අතීත පරිචය අනුව හඳුනා ගැනීම ප්‍රතිපාදන සම්බන්ධ සම්මුතික බැඳීමකි	....
D. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වලින් හෙළිදරව් කරනු ලැබේ	....

38. සීමිත අවිෂා සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් වේ. ඒකක 500,000 මෙහෙයුම් ධාරිතා මට්ටමේදී එහි පිරිවැය තොරතුරු පහත දී ඇත. (රු 000)

මුළු පිරිවැය	15000
මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	8000

මුළු විචල්‍ය පිරිවැය මුළු පිරිවැයෙන් 60% සමාන වේ

ප්‍රාථමික පිරිවැය සමන්විත වන්නේ විචල්‍ය පිරිවැයෙන් පමණි

ඒකකයක් සඳහා විචල්‍ය පොදු කාර්ය පිරිවැය 70 කි

ඒකකයක් සඳහා විචල්‍ය නිෂ්පාදන සාධක පොදු කාර්ය පිරිවැය 40 ක් වේ

පහත දෑ ගණනය කරන්න.

අ) ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය (රු) ....

ආ) මුළු නිෂ්පාදන පිරිවැය (රු) . ...

ඇ මුළු නිෂ්පාදන නොවන පිරිවැය (රු). ....

39. කළමනාකරණ ගිණුම්කරණයේ කාර්යභාරයට අදාළව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

	සත්‍ය/ අසත්‍යය
A. එය ආයතනය පිළිබඳ අතීත සහ අනාගත තොරතුරු සපයයි	....
B. එය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත පිහිටා තොරතුරු සපයනු ලබයි	....
C. ව්‍යාපාරයක කළමනාකරුවන්ගේ ඉල්ලීම මත තොරතුරු ජනනය කරයි	....
D. එය සියළුම ඇල්මැති පාර්ශයවන්ගේ අවශ්‍යතා ගැන අවධානය යොමු කර පිළියෙල කරයි	....

40. ආයතනයක සේවකයන් දෙදෙනෙකු වන නිමල්ගේ හා කමල්ගේ 2025 මැයි මාසයේ වැටුප් විස්තරයේ උපුටනයක් පහත වේ.

අයිතමය	**අමල්**	**බිමල්**	**රු. එකතුව**
මූලික වැටුප	25,000	30,000	55,000
අතිකාල දීමනා	5,000	3,000	8,000
දිරි දීමනා	1,500	-	1,500
දළ වැටුප	31,500	33,000	64,500
අඩු කිරීම්			
EPF සේවක දායකය 10%	2,500	3,000	5,500
උත්සව අත්තිකාරම්	1,500	2,000	3,500
වෘත්තීය සමිති ගාස්තු	75	75	150
මුද්දර ගාස්තු	25	25	50
	27,400	27,900	55,300
EPF සේව්‍ය දායකය 15%	3,750	4,500	8,250
ETF 3%	750	900	1,650

එකලොස් වන පිටුව බලන්න

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

...ල්ගේ හා කමල්ගේ සේවා යෝජකයා වැටුප් ඇතුළු සියළු ගෙවීම් සිදු කරනුයේ ඊළඟ මාසයේ 10 වෙනි දිනය. ...ඒ අනුව 2025 මැයි මාසයේ වැටුප් සම්බන්ධව පහත දෑ ගණනය කරන්න.

අ) 2025 මැයි මාසයේ වැටුප් සම්බන්ධව මෙම ආයතනයට ඇති **මුළු වියදම** කොපමණද? ....

ආ) 2025 මැයි මාසය අවසානයේ ආයතනයට වැටුප් සම්බන්ධව ඇති **මුළු වගකීම** කොපමණද?...............

41. නිෂ්පාදන ආයතනයක ද්‍රව්‍ය පාලන පද්ධතියක පහත එක් එක් ක්‍රියාකාරකමේදි යොදා ගනු ලබන මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.

ක්‍රියාකාරකම	**මූලාශ්‍ර ලේඛනය**
A. ගබඩා අංශය විසින් අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ගැනුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කිරීමට	....
B. නිෂ්පාදන අංශය විසින් ගබඩාවෙන් අමුද්‍රව්‍ය ඉල්ලුම් කිරීමට	....
C. ගැනුම් දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුවන්ගෙන් අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඇණවුමක් කිරීම	....
D. සැපයුම්කරුවන්ගෙන් ගබඩාවට භාණ්ඩ ලැබීම	....

42. පහත සඳහන් අයිතම සංකල්පනාත්මක රාමුව අනුව **ආදායමක් ලෙස හඳුනාගත හැකිද? නොහැකිද** යන්න දක්වන්න

අයිතම	**හඳුනාගත හැකි / නොහැක**
A. අත්පිට විකුණුම්	....
B. මෝටර් රථයක් ප්‍රථමවර ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය	....
C. ගොඩනැගිල්ලක් විකිණීමෙන් ලද ලාභය	....
D. ස්ථාවර තැන්පතුවක් මත ප්‍රවර්ථන වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය	....

43. කම්හලක භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය ආයතනයකට අදාළව පහත තොරතුරු සපයාඇත

අවම පරිභෝජනය දිනක ඒකක	200
සාමාන්‍ය පරිභෝජනය දිනක ඒකක	250
යළි ඇණවුම් ප්‍රමාණය ඒකක	6000

යළි ඇණවුම් කාලය -

අවම දින	15
උපරිම දින	25

ඉහත තොරතුරු ඇසුරින් ගබඩාවේ

අ) උපරිම තොග මට්ටම - ....

ආ) අවම තොග මට්ටම - ....

44. සිමිත සත්සර සමාගම දේශිය වෙළඳපොලේ විදුලි සෝපාන අලෙවි කරනු ලබයි. එම සෝපාන ස්ථාපනය කිරීම සඳහා විශේෂඥ දැනුම අවශ්‍ය බැවින් එම කාර්යය සමාගම විසින්ම කරනු ලබයි. මෙම එක් සෝපාන කට්ටලයක් විකුණුම් මිල හා ස්ථාපනය කිරීමේ ගාස්තුව පිළිවෙලින් 5,000,000 ක් හා 2,500,000 ක් වේ. 2025.03.15 දින විදුලි සෝපාන 10 විකිණීම හා ස්ථාපනය කිරීම සඳහා ගිවිසුමකට එළඹෙන ලදි. ගිවිසුමට පළමුවන දිනයේදී විකුණුම් මිල හා ස්ථාපනය කිරීමේ ගාස්තු ගෙවිය යුතුය.2025.03.31 දින වන විට මින් විදුලි සෝපාන 8 ක් සැපයුම්කරුවන් වෙත ගෙන ගොස් බාර දී ඇති අතර ඉන් 06 ක් ස්ථාපනය කිරීම සම්පූර්ණ කර තිබුණි. S.L.F.R.S.15 (ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් අයභාරය) ප්‍රමිතියට අනුව මෙම ගිවිසුම සඳහා පහත දෑ ගණන කරන්න.

අ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **හඳුනා ගත් අයභාරය** ....

ආ) 2025.03.31 දිනට **කෙටුම්පත් අයභාරය** ....

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

45. L.K.A.S.8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි) ප්‍රමිතියට අනුව පහත එක් එක් අවස්ථා **ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමක්/ ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක්ද වැරදිද** යන්න සඳහන් කරන්න.

ප්‍රතිපත්ති / ඇස්තමේන්තු / වැරදි

A. දේපළ පිරියත හා උපකරණ එක් පන්තියක ගිණුම්කරණ පදනම පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට මාරු කිරීම ....

B. තොග අගය කිරීමට යොදා ගනු ලබන පිරිවැය සූත්‍රය භරිත සාමාන්‍ය (WAC) ක්‍රමයේ සිට පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම ....

C. ආරම්භක තොගය අධි ගණනය වීම නිසා ලාභයේ ඇතිවන වෙනස්වීම ....

D. ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හිනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම ....

- **අංක 45 සහ 46 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න**

සිමිත පෙරේරා සහ සමාගමේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	(රු 000)
ලාභය	1500
පොලි වියදම	300
ආදායම් බදු වියදම	600
සාමාන්‍ය කොටස් සඳහා අතුරු ලාභාංශය	750
2025.03.31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	4500
2024.04.01 දිනට රඳවාගත් ඉපයුම්	3750
2025.03.31 දිනට මුළු වත්කම්	24000

පහත දෑ ගණනය කරන්න.

46. (අ) පොලි ආවරණ අනුපාතය ....

(ආ) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (වසර අග වත්කම් මත) ....

47. (අ) 2025.03.31 දිනට හිමිකම ....

(ආ) ණය අනුපාතය ....

48. සිමිත සමිත් සමාගම නිෂ්පාදනය කරන සෙල්ලම් බෝනික්කු සම්බන්ධ පොදු කාර්ය පිරිවැය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	සත්‍ය	ඇස්තමේන්තු ගත
මුළු පොදු කාර්ය පිරිවැය	120,000	150,000
මුළු සෘජු ශ්‍රම පැය ගණන	7,500	6,000
ඒකකයක් නිපදවීමට අවශ්‍ය සෘජු ශ්‍රම පැය ගණන	3	4

පොදු කාර්ය පිරිවැය අන්තර් ග්‍රහණය කරනු ලබන්නේ සෘජු ශ්‍රම පැය පදනම අනුවය

ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අන්තර්ග්‍රහණය වන **පොදුකාර්ය පිරිවැය** වන්නේ ....

49. නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සමාගමක් සැලසුම් කරමින් සිටී. පහත එක් එක් අයිතමයන් නිසා නව යන්ත්‍රය මිලදී ගැනීමට අදාළ ශුද්ධ වර්තමාන අගය **වැඩි වේ අඩුවේ වෙනස් නොවේ** ද යන්න දක්වන්න.

අයිතමය	**වැඩි වේ/ අඩුවේ / වෙනස් නොවේ**
A. ප්‍රාග්ධන පිරිවැය වැඩිවීම	....
B. නව යන්ත්‍රයේ සුන්බුන් අගය වැඩිවීම	....
C. මූලික ආයෝජන අඩුවීම	....
D. කාරක ප්‍රාග්ධන වැඩිවීම	....

50. ඵලදායි ජීව කාලය වසර 5 ක් සහ සුන්බුන් අගය 300 ක් වන යන්ත්‍රයක් රු. 1000 කට මිලට ගැනීමට සමාගමක් සැලසුම් කරමින් සිටී එහි පිළිගෙවුම් කාලය වසර 2 මාස 6 ක් ලෙස ගණනය කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු පහත පරිදි වේ.

වසර	**ශුද්ධ මුදල් ප්‍රවාහය (රු)**
1	400
2	300
3	....
4	400
5	400

තුන් වන වසර සඳහා

අ) ශුද්ධ මුදල් ප්‍රවාහය .... ආ) ලාභය ....

***

ගිණුම්කරණය I

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

සංශෝධනය

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය 2025
13 ශ්‍රේණිය
ගිණුම්කරණය I පත්‍රය
දිනය - 2025.10.13

ප්‍රශ්න අංක (20) හා (38) පහත ආකාරයෙන් සංශෝධනය විය යුතුය.

20. 2025.03.31 දිනට හිමිකම හා රඳවාගත් ඉපැයුම වන්නේ

	හිමිකම (රු)	රඳවාගත් ඉපැයුම (රු)
(1)	2,150,000	450,000
(2)	2,450,000	350,000
(3)	3,200,000	450,000
(4)	2,050,000	450,000
(5)	2,450,000	300,000

38. සීමිත අවිෂා සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් වේ. <u>ඒකක 50,000</u> මෙහෙයුම් ධාරිතා මට්ටමේදී එහි පිරිවැය තොරතුරු පහත දී ඇත. (රු 000)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

ගිණුම්කරණය	33	S	II	13 ශ්‍රේණිය	පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිත කිරීමට අවසර ලැබේ

උපදෙස් -
- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- නව ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

01. සිරිත අම්බල පොදු සමාගමේ 2025/03/31 දිනට සාරාංශ ගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

විස්තරය	හර	බැර
දේපළ පිරියත උපකරණ	92,000	
දේපළ පිරියත උපකරණ ක්ෂය වෙන් කිරීම		19,800
මුදල් හා මුදල් සමාන දෑ	10,400	
වෙළෙඳ ගෙවිය යුතු දෑ		10,200
වගකීම් සහතික මත ප්‍රතිපාදන (2024.04.01)		700
තොගය (පිරිවැය)	3,550	
විකුණුම්		88,000
විකුණුම් පිරිවැය	36,000	
කල්බදු වගකීම (2024.04.01)		15,850
වෙළෙඳ ලැබිය යුතු දෑ	8,000	
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (2024.04.01)		30,000
ප්‍රත්‍යාගණන සංචිත (2024.04.01)		5,000
රඳවාගත් ඉපැයුම් (2024.04.01)		7,300
ආදායම් බදු ප්‍රතිපාදන (2024.04.01)		950
ගෙවූ ආදායම් බදු	1,700	
නඩු වන්දි සඳහා ප්‍රතිපාදන (2025.03.31)		600
බෙදා හැරීමේ වියදම්	7,000	
පරිපාලන වියදම්	2,260	
වෙනත් වියදම්	2,000	
උපචිත පරිපාලන වියදම්		360
භාවිත අයිතිය සහිත වත්කම්	15,850	
	178,760	**178,760**

අතිරේක තොරතුරු

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත සඳහන් දෑ සඳහා සැලකීම කළ යුතු වේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

1) 2025.03.31 දිනට තොගය භාණ්ඩ 03 කින් සමන්විත වන අතර ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ද අගය පහත පරිදි විය.

අයිතමය	පිරිවැය (රු. 000)	ශුද්ධ උපලබ්දි අගය
x	1,300	1,450
y	1,250	1,100
z	1,000	700
	3,550	3,250

පිරිවැය හා ශුද්ධ උපලබ්දි අගය යන දෙකෙන් අඩු අගයට තොග මිනුම් කිරීමේදී අයිතම ක්‍රමය පදනම් කර ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ

2) පහත සඳහන් තොරතුරු දේපළ පිරියත උපකරණ හා බැදේ. (සියළු වටිනාකම් රු. 000 දි ඇත.)

විස්තරය	2025.03.31 දිනට පිරිවැය/ ප්‍රත්‍යාගණිත අගය	2025.03.31 දිනය සමුච්චිත ක්ෂය	වාර්ෂික ක්ෂය අනුපාතය
ඉඩම	38,000	-	-
ගොඩනැගිලි	36,000	10,800	5%
මෝටර් රථ	18,000	9,000	20%

2024.04.01 දින ගොඩනැගිල්ල රු. 31,000,000 ට දෙවනවරට ප්‍රත්‍යාගනනය කළ අතර 2019.04.01 දිනට ප්‍රථමවරට ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය් කිරීමේදී රු. 1,800,000 ඌනතාවයක් ඇති විය. දෙවන වරට ප්‍රත්‍යාගණනයෙන් පසු ගොඩනැගිලි වල ඵලදායි ජීව කාලය වසර 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ගොඩනැගිලිවල සුන්බුන් අගය ශුන්‍ය බව උපකල්පනය කරන්න. දෙවන වරට ප්‍රත්‍යාගණනයට අදාළව කිසිදු සටහනක් පොත්වල තබා නැත. වාර්ෂික ක්ෂය නිසි පරිදි ගිණුම් ගත කර ඇති අතර ප්‍රත්‍යාගණනය සැලකිල්ලට ගෙන නැත.

3) 2024.07.01 දින පිරිවැය 7,000 000 ක් ඉඩමක් රු. 8,500 000 ට විකුණන ලදි. ඒ සම්බන්ධව කිසිදු සටහනක් පොත්වල තබා නැත.

4) මෝටර් රථය බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිතා කරන අතර අනෙක් සියළුම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිතා කරයි.

5) කාර්යාල උපකරණයක් භාවිත අයිතියට වසර 4 ට ලබා ගැනීම සඳහා 2024.04.01 දින සමාගම විසින් කල්බදු ගිවිසුමකට එළඹෙන ලදි. කල්බදු ගිවිසුමට අනුව 2025.03.31 දින සිට රු. 5,000,000 බැගින් වාර්ෂික කල්බදු වාරික ගෙවිය යුතුය. මුළු කල්බදු පොලිය 4,150,000 නක් වන අතර 2024 හා 2025 වසර සඳහා කල්බදු පොලිය පිළිවෙලින් 1,585,000 හා 1,243,000 ක් වේ.

කාර්යාල උපකරණ සඳහා මූලික ගෙවීම 4,150,000 ක් වන අතර එය මුදල් පොතේ වාර්තා කොට බෙදාහැරීමේ වියදම් තුළ ඇතුලත් කොට ඇත භාවිත අයිති සහිත වත්කමේ ඵලදායි ජීව කාලය වසර 5 ක් වන අතර ජීව කාලය අවසානයේ වත්කමේ අයිතිය නැවත කල්බදු සමාගමට භාරදිය යුතුය. වාර්ෂික කල්බදු වාරිකය නිසි පරිදි ගෙවීමට නොහැකි වූ අතර එය 2025.06.10 දින ගෙවන ලදි.

6) සමාගම භාණ්ඩ අලෙවි කරනු ලබන්නේ වසරක වගකීම් කාලයක් සහිතව වන අතර 2025.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය 1,250,000ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වගකීම් සහතික යටතේ භාණ්ඩ අළුත්වැඩියා කිරීම රු. 750,000 ක් වැය කරන ලද අතර එය වෙනත් වියදම් තුළ දක්වා ඇත.

7) සමාගමට එරෙහිව ගනුදෙනුකරුවෙකු පවරා තිබූ නඩුවක් තීන්දුව 2025.06.10 ප්‍රකාශයට පත්කරන ලද අතර එය ගනුදෙනුකරුට රු. 750,000ක වන්දියක් ගෙවන ලදි. මෙම නඩුව 2024.12.31 දින පවරා තිබුනි. කෙසේ වුවද සමාගමේ නීතිඥවරයාගේ මතය අනුව මේ සඳහා (2025.03.31 දිනට) හඳුනාගත් ප්‍රතිපාදනය ශේෂ පිරික්සුම තුළ දක්වා ඇත. 2025/06/15 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

8) ගෙවන ලද ආදායම් බදු තුළ පෙර වසර සඳහා ගෙවූ බදු රු. 800,000 ක් හා ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු 3 සඳහා ගෙවූ ආදායම් බද්ද ඇතුළත් වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද 450,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

9) සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ රු. 400,000 බෙදා හැරීමේ වියදම් තුළ ඇතුළත්ය.

10) මූල්‍ය ප්‍රකාශන 2025.06.15 අනුමත කළ අතර සමාගම වෙළඳ ලැබිය යුතු දෑ තුළ ඇති 500,000 ක් වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරන අලාභ ලෙස 2025.05.15 වන දින උසාවිය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

අවශ්‍ය වන්නේ

LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත අබිල පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

i. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

ii. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

iii. 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 40)**

02. අ) සීමිත නදුන් සමාගම සතුව සැකසුම් හා බෝතල් කිරීම යන නිෂ්පාදන අංශ 2 ක් සමන්විත කර්මාන්ත ශාලාවක් සහ සේවා අංශයක් වන ගබඩාවක් සහිත වේ. කර්මාන්ත ශාලාව සහ ගබඩාව වෙන් වෙන්ව ගොඩනැගිලිවල පිහිටා ඇත.

ඉදිරි වසරක කාලයක් සඳහා අයවැය ගත තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	**කර්මාන්ත ශාලාව (රු)**	**ගබඩාව**	**එකතුව**
ආරක්ෂක සේවා ගාස්තු	?	?	180,000
ගොඩනැගිලි සඳහා වරිපනම්	45,000	15,000	60,000
යන්ත්‍ර රක්ෂණ	90,000	20,000	110,000
විදුලිය	60,000	30,000	90,000
වක්‍ර වේතන	?	?	200,000
කුලිය	90,000	50,000	140,000

අනෙකුත් තොරතුරු

විස්තරය	**සැකසුම්**	**බෝතල්**	**ගබඩාව**
වක්‍ර සේවක සංඛ්‍යාව	10	15	15
භූමිප්‍රමාණය	6,000	9,000	4,000
නිෂ්පාදන යන්ත්‍ර (පිරිවැයට)	200,000	100,000	
සිසිල් කරන යන්ත්‍රය (පිරිවැයට)	-	-	250,000
කාලච්ඡේදය සඳහා යන්ත්‍ර පැය	73,000	50,000	-
ආරක්ෂක සේවක සංඛ්‍යාව	2	2	4
කාලච්ඡේදය සඳහා මුළු කිලෝ වොට් පැය	3,000	2,000	1,000
කාලච්ඡේදය සඳහා මුළු ශ්‍රම පැය	10,000	15,000	-
ඉදිරිපත් කරන ලද ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව	10	20	-

අතිරේක තොරතුරු

1) නිෂ්පාදන යන්ත්‍ර හා සිසිල් කිරීමේ යන්ත්‍ර පිළිවෙලින් 10% ක් හා 8% ක් ක්ෂය කරනු ලබයි
2) ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය සැකසුම් හා බෝතල් කිරීමේ අංශ අතර ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව මත විභජනය කරනු ලබයි
3) නිෂ්පාදන සැකසුම් අංශයේ පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය මත ද බෝතල් කිරීමේ අංශයේ පොදු කාර්ය පිරිවැය ශ්‍රම පැය මත ද අන්තර් ග්‍රහණය කරයි
4) සමාගම විසින් මුළු නිෂ්පාදන හා පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් එකතු කර භාණ්ඩ විකුණනු ලබයි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

පහත තොරතුරු සමාගම විසින් නිපදවන අඹ හා දොඩම් නිෂ්පාදන හා බැඳේ.

විස්තරය	අඹ (ඒකකයක් සඳහා)	දොඩම් (ඒකකයක් සඳහා)
ගත කළ සත්‍ය පැය - සැකසුම් දෙපාර්තමේන්තුව (යන්ත්‍ර පැය)	12	15
බෝතල් කිරීමේ දෙපාර්තමේන්තුව (ශ්‍රම පැය)	3	2
නිෂ්පාදන ප්‍රාථමික පිරිවැය (රු)	347	?
විකුණුම් මිල (රු)	?	900

අවශ්‍ය වන්නේ

i. විභජන පදනම නම් කරමින් පොදු කාර්ය විශ්ලේෂණ පත්‍රිකා (ද්විතීයික විභජනයට ද ඇතුළත්ව)

ii. නිෂ්පාදන දෙපාර්තමේන්තු 2 සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

iii. අඹ නිෂ්පාදන ඒකකයක් (බෝතලයක්) සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හා ඒකකයක විකුණුම් මිල

iv. දොඩම් ඒකකයක් සඳහා (බෝතලයක්) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හා ඒකකයක ප්‍රාථමික පිරිවැය

(ලකුණු 20)

ආ) 2025 ජුලි මාසය සඳහා සේවක වේතන වලට අදාළ සීමිත වමිලාහි පොදු සමාගමේ තොරතුරු පහත දැක්වේ.

මාසය තුළ වැඩ කළ පැය ගණන

සේවකයාගේ නම	සතියේ දිනවල	සති අන්ත දිනවල
හදූනි	175	15
සදූනි	170	18
මිතුනි	160	10

අනෙකුත් තොරතුරු

මාසය තුළ (සතියකට පැය 40 බැගින්) පැය 160 ක් වැඩකළ යුතුය.

පැයකට රු. 200 ක් බැගින් වැටුප් ගෙවනු ලබයි

අතිකාල පැයක් සඳහා වැටුප් අනුපාතිකය

සතියේ දිනවල පැයකට රු. 300

සති අන්ත දිනවල පැයකට රු. 400

සේවක අර්ථ සාධක අරමුදල් දායකයත් - සේවා 15%

- සේවක 10% ක් වේ

සේවක භාරකාර අරමුදල් දායකය - සේවා 3% ක් වේ

සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගණනයේදී අතිකාල දීමනා සැලකිල්ලට නොගනී

වැටුපෙන් කරන අඩුකිරීම්

- සියළුම සේවකයන්ගෙන් මාසිකව සුභ සාධක අරමුදලට රු. 400 බැගින් අය කරයි
- හදූනිගේ ආපදා ණය වාරිකය රු. 2000 ක් අඩු කරයි
- සදූනිගේ නිවාස ණය වාරිකය රු. 5000 ක් අඩු කරයි

සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ඊළඟ මස 10 වන දිනට ප්‍රේෂණය කරන අතර වැටුප අදාල මාසයේදීම ගෙවයි.

2025 ජුලි 01 දිනට ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල හා ගෙවිය සේවක භාර අරමුදල පිළිවෙලින් 24,000 හා 2880 ක් වේ.

අවශ්‍ය වන්නේ

i. 2025 ජුලි මාසය සඳහා පහත ආකෘතිය භාවිතා කරමින් වැටුප් ලේඛනය පිළියෙල කරන්න.

ii. වැටුප් පාලන ගිණුම

iii. ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් ගිණුම හා භාරකාර අරමුදල් ගිණුම පිළියෙල කරන්න.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
CamScanner

සේවකයාගේ නම	ඉපයීම			අඩු කිරීම					සේවක ආයකත්වය	
	මූලික වැටුප	අතිකාල	දළ වැටුප	සේ.අර්.අ.	සේවක ණය	සේවක සුභ සාධන	මුළු අඩු කිරීම	ශුද්ධ වැටුප	සේ.අ.අ.	සේ.භා.අ

(ලකුණු 20)

03. අ) ප්‍රභා සේවා ව්‍යාපාරයේ 2025.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි විය. ව්‍යාපාරය VAT ලියාපදිංචි වන අතර ව්‍යාපාරය විසින් සපයන සෑම සේවාවක් සඳහාම සපයන ලද සේවාවේ වටිනාකම මත 5% ක් VAT ගෙවිය යුතුය.

වත්කම්	රු. 000
කාර්යාල උපකරණ (පිරිවැය 270,000)	250
සේවා තොග	150
වෙළඳ ලැබිය යුතු දෑ	50
බැංකු	70
	520
හිමිකම	460
වගකීම්	
ගෙවිය යුතු VAT	20
වෙළඳ ගෙවිය යුතු දෑ	40
	520

2025 අප්‍රේල් මාසය තුළදි සිදු වූ ගනුදෙනු හා සිදුවීම් පහත පරිදි විය.

4/3 රු. 120,000 ක සේවා අත්පිට මුදලට සපයන ලදි

4/5 ලකුණු කළ මිල රු. 23,000 ක් වූ සේවා භාණ්ඩ තොගයක් රු 20000 ට ණයට ගන්නා ලදි

4/8 4/5 දින ලබාගත් භාණ්ඩ තොගයෙන් අඩක් නැවත සැපයුම්කරු වෙත හරවා යවන ලදි

4/12 වෙළඳ ලැබිය යුතු දෑ වලින් රු. 15,000 ක වටිනාකමක් පියවීමට රු. 14,000 ක් ලැබුණු අතර ඉතිරිය වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරන අලාභ ලෙස කපා හරින ලදි.

4/15 පිරිවැය 45,000 ක් වූ කාර්යාල උපකරණ මිලට ගත් අතර එය ව්‍යාපාරයට ගෙන ඒමට රු. 3000 ක් හා සවිකිරීම සඳහා 2000 ක් වියදමක් දරණ ලදි. මෙහි සුන්බුන් අගය 2000 ක් ලෙසත් ඵලදායි ජීවකාලය වසර 2 ක් බවත් මිලට ගත් දින ඇස්තමේන්තු කළ අතර මිලට ගත් දින සිටම එය භාවිත කිරීමට හැකි විය. ව්‍යාපාරයේ පෙර සිට පැවති කාර්යාල උපකරණ වල ඵලදායි ජීව කාලය වසර 3 ක් වන අතර සුන් බුන් අගයක් නොමැත.

4/18 මාසයට අදාළ ජල බිල්පත රු. 4000 ක් වූ අතර ඒ සඳහා චෙක්පතක් නිකුත් කරන ලදි

4/20 මාර්තු මාසයේ සපයන ලද රු. 20,000 ක ස්වාවක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මගහැරී තිබුණි.

4/23 2024/4/1 දිනට පැවති වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂය පියවීමට රු. 38,000 ක් මුදලින් ගෙවූ අතර ඉතිරිය වට්ටම් සේ සලකන ලදි.

4/27 4/12 දින කපා හරින ලද වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරන අලාභමුදලින් ලැබුණි.

4/30 මාසය සඳහා වූ රු. 3000 ක විදුලි බිල ගෙවීම සඳහා අයිතිකරු පුද්ගලික මුදලින් රු. 2000 ක් හා ඉතිරිය ව්‍යාපාරයේ මුදල් ද යොදා ගෙවා දමන ලදි.

අවශ්‍ය වන්නේ

i. ඉහත ගනුදෙනු නිවැරදිව පහත ගිණුම්කරණ සමීකරණයේ ගැලපීම

රු(000)

	වත්කම්			=	වගකීම්	+	හිමිකම
ගනුදෙනු අංකය	කාර්යාල උපකරණ	සේවා තොග	වෙළඳලැබිය යුතුදෑ	බැංකු	ගෙවියයුතු	වෙළඳගෙවිය යුතුදෑ	හිමිකම

ii. 2025/4/30 න් අවසන් මාසය සඳහා ශුද්ධ වත්කම් මත පදනම්ව ලාභය හෝ අලාභය ගණනය කිරීම

(ලකුණු 30

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

ආ) සහන සෙවන සමාජ සුභසාධක සංවිධානයේ පහත තොරතුරු ඔබට සපයයි.

	2025/3/31 දිනට	2024/3/31 දිනට
දේපළ උපකරණ (ධාරණ අගය)	325,000	250,000
හිඟ සාමාජික මුදල්	4,500	3,000
ඉදිරියට ලද සාමාජික මුදල්	6,000	12,000
බැංකු ණය	30,000	50,000
ලිපිද්‍රව්‍ය තොග	8,000	3,000
උපචිත විදුලිය	2,000	1,000
ආයෝජන 10%	100,000	100,000
ලැබිය යුතු ආයෝජන ආදායම්	?	2,000

ලැබීම් ගෙවීම් ගිණුම (රු)

ඉ/ගෙ	20,000	ලිපිද්‍රව්‍ය	87,000
සාමාජික මුදල්	135,000	බැංකු ණය	20,000
පරිත්‍යාග	200,000	දේපළ පිරියත උපකරණ	90,000
ආයෝජන ආදායම්	8,000	විදුලිය	9,000
		ආධාර	80,000
		ගමන් වියදම්	15,000
		ප/ගෙ	62,000
	363,000		363,000

අනෙකුත් තොරතුරු

1) පරිත්‍යාග වර්ෂ දෙකක් තුළ ආදායමට හඳුනා ගත යුතුය

2) ලිපි ද්‍රව්‍ය කාර්යාලයේ වැඩ කටයුතු සඳහා ලබා ගනී

අවශ්‍ය වන්නේ

i. සාමාජික මුදල් ගිණුම

ii. 2025/03/31 න් අවසන් වසරේ ආදායම් වියදම් ගිණුම

(ලකුණු 10)

04. අ) ජනකාන්ත ව්‍යාපාරයේ 2024/12/31 දිනට ශේෂයන් පහත දැක්වේ. මෙම ව්‍යාපාරයේ *VAT* (8%) ලියාපදිංචි වූ ව්‍යාපාරයකි.

වෙළඳ ලැබිය යුතු දෑ	160,000
වෙළඳ ගෙවිය යුතු දෑ	200,000
බැංකු ණය	500,000
දේපළ පිරියත උපකරණ	600,000
මුදල් හා මුදල් සමාන දෑ	67,000
VAT පාලන	1,750 (බැ/ර)
දේපළ පිරියත උපකරණ ක්ෂය වෙන් කිරීම	18,000

ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත පරිදි වේ

ගනුදෙනුකරු	විකුණුම්		මුදල් ලැබීම		බොල් ණය
	ලකුණු කළ මිල	වට්ටම් ප්‍රතිශතය	ලද මුදල්	වට්ටම් ප්‍රතිශතය	
අජිත්	150,000	10%	23,750	5%	–
සුජිත්	80,000	5%	45000/-	10%	–
කමල්	40,000	–	–	–	5,000
	ලකුණු කළ මිල	වට්ටම් ප්‍රතිශතය	ලද මුදල්	වට්ටම් ප්‍රතිශතය	
දිනිෂ	50,000	5%	45,000	5%	2,000
කවිෂ	140,000	-	30,000	–	5,000
මලිෂ	80,000	10%	52,000	10%	–

අතිරේක තොරතුරු

1) ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම රු. 2500
2) ව්‍යාපාරය 400,000 ක් වටිනා මෝටර් රථයක් ණයට අත්පත් කර ගන්නා ලදී. ඒ තුළ ඇතුළත් VAT අගය 40,000 කි
3) රු. 6,000ක පොලියක් සහිතව 40,000 ක බැංකු ණය වාරිකයක් ගෙවනලදී
4) වර්ෂයට අදාළ දේපළ පිරියත උපකරණ ක්ෂය රු. 25,000 කි
5) සියළුම ගැනුම් හා විකුණුම් මත 8% VAT බදු මුදලක් අය කිරීම
6) මාසය තුළ අත්පිට විකුණුම් රු. 200,000 සහ අත්පිට ගැනුම් 150,000 ක් සිදු කර ඇත.

අවශ්‍ය වන්නේ,

i. 2025 ජනවාරි මාසය සඳහා පහත මූලික සටහන් පොත්
   a. මුදල් ලැබීම් ජර්නලය
   b. මුදල් ගෙවීම් ජර්නලය
   c. විකුණුම් ජර්නලය
   d. ගැනුම් ජර්නලය
   e. පොදු ජර්නලය

ii. 2025 ජනවාරි මාසය සඳහා පහත ලෙජර් ගිණුම්
   a. මුදල් පාලන ගිණුම
   b. ණයගැති පාලන ගිණුම
   c. ණයහිමි පාලන ගිණුම
   d. VAT පාලන ගිණුම

(ලකුණු 30)

ආ) සමාගමක් තම නිෂ්පාදන කටයුතු කාර්යක්ෂමව කිරීම වෙනුවෙන් දැනට පවතින යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍රයක් මිලට ගැනීමට සැලසුම් කර ඇත. නව යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 5 ක් වන අතර ඊට අදාළව පහත තොරතුරු සපයා ඇත.

විස්තරය	නව යන්ත්‍රය	දැනට පවතින යන්ත්‍රය
පිරිවැය	600,000	
වර්තමාන වෙළඳපොළ වටිනාකම		250,000
සුන්බුන් අගය	100,000	-

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

1) දැනට පවතින යන්ත්‍රය භාවිතා කරමින් නිෂ්පාදන ඒකකයක් වෙනුවෙන් රු. 50 ක පිරිවැයක් දැරිය යුතු අතර ඒකකයක් විකිණිය හැක්කේ රු. 100 කට පමණි.

2) නව යන්ත්‍රය මිලට ගත හොත් ශ්‍රම පිරිවැය හා අමුද්‍රව්‍ය අපතේ යාම අවම විම නිසා ඒකකයක් වෙනුවෙන් දැරිය යුතු පිරිවැය රු. 40 ක් දක්වා පහළ යන අතර නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ඉහළ යාම නිසා ඒකකයක් 120 කට අලෙවි කිරිමටද හැකියාව ලැබේ

3) ඉදිරි වසර 5 තුළදි පවතින යන්ත්‍රය භාවිතා කළ හොත් හා නව යන්ත්‍රය භාවිතා කළ හොත් නිපදවිය හැකි නිෂ්පාදන ඒකක පහත දැක්වේ.

වසර	1	2	3	4	5
පවතින යන්ත්‍රය මගින්	800	1100	1300	1000	1200
නව යන්ත්‍රය මගින්	1000	1200	1500	1200	1300

4) නව යන්ත්‍රය මිලදි ගන්නේ නම් දැනට පවතින රු. 200,000 කාරක ප්‍රාග්ධනය රු. 250,000 දක්වා වැඩි කළ යුතු අතර වැඩියෙන් යෙදවිය යුතු කාරක ප්‍රාග්ධනය ව්‍යාපෘතිය අවසානයේදි නැවත උපලබ්ධි වේ

5) ව්‍යාපෘතිය 10% අපේක්ෂිත ප්‍රතිලාභය යටතේ වට්ටම් සාධක පහත පරිදි වේ

වර්ෂය	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍ය වන්නේ

i. ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායෑම් (ඒක් එක් මුදල් ප්‍රවාහ අයිතම වෙන් වෙන් ව දක්වමින්)

ii. නව යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය

iii. නව යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය මතපදනම්ව මිලට ගැනිම සුදුසුද නැද්ද යන්න හේතු සහිතව දැක්වි

(ලකුණු 10)

05. සම සමව ලාභ බෙදා ගැනීමේ ඒකගතාවයට යටත්ව පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ වසන්ත හා සමන්ත හවුල් කරුවෝ වෙති.2024.04.01 දින නව හවුල් කරුවෙකු ලෙස නිමන්ත බඳවා ගැනීමත් සමඟ පහත ඒකඟතා ඇති කර ගන්නා ලදි.

- වසන්ත , සමන්ත හා නිමන්ත ලාභාලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදා ගැනිම
- සෑම හවුල්කරුවෙකුම ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10%ක වාර්ෂික පොළියක් ලැබීමට හිමිකම් ලබයි.
- හවුල් කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා වාර්ෂකව 10% පොළයක් හිමිවිම.
- සෑම හවුල් කරුවෙකුටම පළමු මාස 06 තුල මසකට රු7500 වේතනයක්ද , ඊ ලඟ මාස 06 තුළ මසකට රු12500 ක වේතනයක්ද හිමිවිම.
- නිමන්ත බඳවා ගත් දින හවුල් ව්‍යාපාරයේ කිර්ති නාමය 1000,000 කට ඇස්තමේන්තු කර ප්‍රාග්ධන ගිණුම තුලින් ගැලපිම.

...5.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ. (000)

විස්තරය	හර	බැර
දේපල පිරියත හා උපකරණ පිරිවැය	8000	
වෙළඳ ලැබිය යුතු දෑ	600	
විකුණුම් පිරිවැය	5844	
අනෙකුත් මෙහෙයුම් වියදම්	90	
සේවක වැටුප්	900	
විදුලිය	69	
මුදල් හා මුදල් සමාන දෑ	4016	
2025.03.31 දිනට තොගය	385	
හවුල් වේතන - වසන්ත	220	
සමන්ත	220	
නිමන්ත	220	
ගැනිලි - වසන්ත	36	
ප්‍රාග්ධන ගිණුම - වසන්ත		3000
සමන්ත		3000
නිමන්ත		1000
ජංගම ගිණුම වසන්ත		360
සමන්ත		240
2024.10.01 දින සමන්ත ලබා දුන් ණය		2000
වෙළඳ ගෙවිය යුතු දෑ		300
විකුණුම්		9800
ලද වට්ටම්		45
2024.04.01 දිනට දේපල පිරියත උපකරණ සමුච්චිත ක්ෂය		800
අවිනිශ්චිත ගිණුම		55
	20600	20600

අතිරේක තොරතුරු-

1.ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් පසුව පහත වැරදි සිදු වී තිබූ බව අනාවරණය විය.

- රු.5000 ක ලද වට්ටම්, ලද වට්ටම් ගිණුමට හා වෙළඳ ගෙවිය යුතු දෑ ගිණුමට හර කර තිබීම
- විදුලිය සඳහා ගෙවූ රු12000ක විදුලි වියදම, විදුලි වියදම ගිණුමට රු21000ක් ලෙස පිටපත් වී තිබීම
- වසන්ත විසින් සිදු කල රු36000ක භාණ්ඩ ගැනිලි ,ගැනිලි ගිණුමට පමණක් පිටපත් කර තිබීම.

2.දේපල පිරියත උපකරණ තුල පිරිවැය 4,000,000 ක් වූ ඉඩම් ඇති අතර අනෙකුත් දේපල පිරියත හා උපකරණ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කල යුතුය.වර්ෂය තුල දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදු කර නොමැත.

3. 2025.03.31 දිනට උපචිත විදුලිය 10000ක් වූ අතර උපචිත වැටුප් 80000කි.

4.නිමන්තගේ පෞද්ගලික ආදායම් බදු රු30000ක් ව්‍යාපාරය විසින් ගෙවා ව්‍යාපාරයේ මෙහෙයුම් වියදම් ලෙස සටහන් කර ඇත.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

අවශ්‍ය වන්නේ,

1.ශේෂ පිරික්සුමෙන් අනාවරණය වූ වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන්

2. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපරයේ ආදායම් ප්‍රකාශනය (හවුල් කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුලුව)

3.2025.03.31 දිනෙන් අවසන් වර්ශය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් පිළියෙල කරන්න. (ලකුණු 30)

ආ) පහත තොරතුරු සීමිත වේනුක පොදු සමාගමට අදාළ වේ.

1) 2025/03/31 දිනට වත්කම් හා වගකීම් (රු. 000)

මුළු වත්කම්		මුළු වගකීම්	
දේපල පිරියත උපකරණ (පිරිවැය)	5000	දිගුකාලීන බැංකු ණය	1200
දේපළ පිරියත උපකරණ (සමුච්චිත ක්ෂය)	850	(2024/04/01)	
වෙළඳ ලැබිය යුතු දෑ	700	වෙළඳ ගෙවිය යුතු දෑ	540
තොගය	300	ගෙවිය යුතු බැංකු ණය පොලී	60
ඉදිරියට ගෙවූ වියදම්	50		
මුදල්	10		

2) 2025/03/31 න් අවසන් වසරේ (රු. 000)

විකුණුම්	6600
බදු පසු ලාභය	1300
බදු වියදම	300

අතිරේක තොරතුරු

1) සියළු ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු කරයි
2) 2025/03/31 න් අවසන් වසරේ වෙළඳ ලැබිය යුතු දෑවල ශුද්ධ වැඩිවීම රු. 80,000 කි
3) වර්ෂය තුළ ගෙවා ඇති බැංකු ණය පොලිය 140,000 කි

අවශ්‍ය වන්නේ

i. ක්ෂණික අනුපාතය
ii. ණයගැති පිරිවැටුම් අනුපාතය
iii. පොලී ආවරණ අනුපාතය
iv. මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
v. ණය අනුපාතය (ලකුණු 10)

06.අ) 2025.03.31 න් අවසන් වර්ෂයට අදාළව සීමිත දිමුතුමුතු පොදු සමාගමේ පහත තොරතුරු ඔබට සපයයි.

සීමිත දිමුතුමුතු පොදු සමාගම 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (රු. 000)

	2025.03.31	2024.03.31
ඉඩම (ප්‍රත්‍යාගණිත අගය)	2,500	2,000
ගොඩනැගිලි (පිරිවැය)	1,200	1,700
ගොඩනැගිලි (සමුච්චිත ක්ෂය)	(200)	(180)
කාර්යාල උපකරණ (පිරිවැය)	450	300
කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය	(85)	(50)
10% ආයෝජන (2024.07.01 ආයෝජනය කළ)	800	-
වෙළඳ ලැබිය යුතු දෑ	170	280
	160	120
මුළු වත්කම්	5,100	3, 910

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	3,000	2,500
රඳවා ගත් ඉපයුම්	370	520
ප්‍රත්‍යාගණන සංචිත	600	400
පොදු සංචිත	330	180
බැංකු ණය (2024.04.01)	500	
ගෙවිය යුතු ණය පොලී	25	-
ආදායම් බදු වෙන් කිරීම	30	20
වෙළඳ ගෙවිය යුතු දෑ	210	270
ගෙවිය යුතු ලාභාංශ	35	20

අතිරේක තොරතුරු

1) 2025.03.31 න් අවසන් වර්ෂයේ සමාගම ඉපයු බදු පෙර ලාභය රු. 340,000 ක් විය
2) සාමාන්‍ය කොටස් සඳහා වර්ෂය තුළදී රු. 80,000 ක ලාභාංශයක් ගෙවීමට යෝජනා සම්මත කළ අතර එය නිසි පරිදි ගිණුම්ගත කර ඇත
3) වර්ෂය තුළදී රු. 300,000 ක ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් ද රඳවාගත් ඉපයුම් භාවිත කරමින් ප්‍රසාද කොටස් නිකුතුවක් සිදු කර ඇත.
4) 2024/10/15 දින නව ඉඩම් කැබැල්ලක් මිලට ගත් අතර පෙර සිට පැවති ඉඩම වෘත්තිය තක්සේරුකරුවෙකු විසින් ප්‍රත්‍යාගණනය ද කර ඇත. ඉඩම්හැර අනෙකුත් දේපළ පිරියත කිසිවක් වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනය කර නොමැත.
5) බැංකු ණය සඳහා වර්ෂයට අදාළව ගෙවිය යුතු පොලියෙන් තවමත් ගෙවා ඇත්තේ අඩක් පමණි.

අවශ්‍ය වන්නේ

i. *LKAS* 07 ට අනුව 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ලකුණු 20)

(ආ) මහනුවර නගරයේ පාසලක වාණිජ අංශයේ ළමුන් කොළඹ ප්‍රදේශයට අධ්‍යාපන චාරිකාවක් කැඳවාගෙන යාමට සැලසුම් කර ඇත. එය දින දෙකක් සඳහා සැලසුම් කිරීමට බලාපොරොත්තු වේ. පළමු දින ළමුන්ගේ විඩාව සංසිඳීමට සංගීත ප්‍රසංගයක් හා පිහිනුම් තටාංකයක් සහිත සුව පහසු ස්ථානයක නැවතීමට අපේක්ෂා කරයි. එම චාරිකායට අදාළ අපේක්ෂිත ආදායම හා පිරිවැය පහත පරිදි වේ.

එක් බස් රථයක් සඳහා	125,000
එක් සිසුවෙකුට ලිපි ද්‍රව්‍ය සඳහා	500
පිහිණුම් තටාංගනය සඳහා	77,500
සිසුවෙකුට රාත්‍රි කාමර කුලිය	2500
සංගීත කණ්ඩායමට	120,000
ශාලාව සඳහා කුලිව	100,000
ආකල්ප සංවර්ධන දේශය සඳහා	
දේශන ගාස්තුව	80,000
එක් අයෙකු සඳහා ආහාර සඳහා	5,000

චාරිකාව සඳහා ළමුන් 125 දෙනෙකු සහ ගුරුවරුන් 5 දෙනෙකු සහභාගි වීමට නියමිතය. ගුරුවරුන් සඳහා ආහාර පාන නවාතැන් පහසුකම් නොමිලේ අනුග්‍රාහකයෙකු ලබාදීමට එකඟ වී ඇත. අනෙකුත් වියදම් සඳහා ගුරුවරුන්ගෙන් මුදල් අය නොකරයි. බස් රථයක ගමන් කළ හැකි උපරිම ගණන 40 කි.
චාරිකාව සඳහා **පහත දෑ ගණනය කරන්න**

i. චාරිකාව සඳහා විචල්‍ය පිරිවැය
ii. චාරිකාව සඳහා එක් සිසුවෙකුගෙන් අය කළ යුතු මුදල
iii. ආහාර පාන නවාතැන් ගුරුවරුන් සඳහා නොමිලේ ලබා නොදෙන්නේ නම් එක් සිසුවෙකුගෙන් අය කළ යුතු මුදල

ගුරුවරුන් සඳහා ආහාර නවාතැන් නොමිලේ ලබා දෙන අතර එක් සිසුවෙකුගෙන් 14500 අයකරන්නේ නම් සහභාගි විය යුතු සිසුන් ගණන (ලකුණු 20)

***

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner